# මුස්ලිම් නිවසක විනය හා යහපැවැත්ම

[ සිංහල – Sinhala – سنهالي ]

ෂෙයිඛ්. මුහම්මද් බින් සාලිහ් අල්-මුනජ්ජිද්

2013 - 1434

IslamHouse.com

# آداب البيت وأحكامه

« باللغة السنهالية »

محمد صالح المنجد

ترجمة: ماهر رمدين

2013 - 1434

IslamHouse.com

# මුස්ලිම් නිවසක විනය හා යහ පැවැත්ම

සියලු ප්‍රශංසා අල්ලාහ් සතුයි. ශාන්තිය හා සමාදානය අල්ලාහ්ගේ දූත මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ඇතුළු දැහැමි සියලු දෙනා වෙත හිමි වේවා.

තක්වා නම් බියබැතිමත්කමට වඩා වෙනත් යම් කිසිදු ක්‍රියාවක් තුළින් හෝ විනයක් තුළින් හෝ නිවසක අලංකාරය, අභිවෘද්ධිය ලබා ගත නොහැක. සෑම නිවසකම ලොකු, කුඩා, පිරිමි, කාන්තා, යන සෑම සාමාජික සාමාජිකාවක්ම අල්ලාහ්ගේ නියෝගයන් වලට අවනතව ක්‍රියා කළ යුතුයි. එමගින් සාර්ථක දිවි පැවැත්මක් ගත කරන්නටත්, නිවැසියන් දහම තුළ කටයුතු කරන්නටත් ඉවහල් වනු ඇත.

අද බොහෝ මුස්ලිම්වරු තමන්ගේ නිවැස් ආරක්ෂා කර ගැනීමටත් එහි අලංකාරය පවත්වා ගැනීමටත් එහි අභිවෘද්ධිය උදෙසාත් නොයෙකුත් කටයුතුවල නිරත වෙති. ඔවුන් ඒ සඳහා උත්සාහ දරණ සමහර දෑ ඉස්ලාමයට අනුකූල වුව ද තවත් සමහර දෑ ඉස්ලාමයට සම්පූර්ණයෙන් පටහැනි වන්නේය.

මුස්ලිම්වරු වශයෙන් අපි අනුගමනය යුත්තේ අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් අපට පෙන්වා දී ඇති මඟ පමණය. මිථ්‍යා මත අනුගමනය කිරීම, මන්ත්‍ර ගුරුකම් කිරීම යනාදියෙන් ද අල්ලාහ්ට ආදේශ තබන දැයින් ද, ඔහු විසින් අනුමත නොකළ, ෂෙයිතාන්ගේ මාර්ගයේ කටයුතු කිරීමෙන් ද වැළකිය යුතුය.

එබැවින් මුස්ලිම්වරුන් තම නිවසට අභිවෘද්ධිය ලබා ගත හැකි, ෂෙයිතාන්ගේ හානියෙන් ආරක්ෂා විය හැකි, සහ නිවස අලංකාරමත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයන් සමහරක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. ඒ අනුව, ෂෙයිඛ්. මුහම්මද් බින් සාලිහ් අල්-මුනජ්ජිද් යන අය

විසින් සංස්කරණය කරන ලද නිවසක විනය හා එහි පිළිපැදිය යුතු නීතිරීති යන මැයින් අරාබි බසින් ලියවුනු පොත් පිංචය උපුටා ගනිමින් අල්ලාහ්ගේ අභිමතය පරිදි ඔබ අත මෙම කුඩා පොත් පිංචය තබමි.

මෙහි යම් අඩුපාඩුවක් හෝ අතපසුවීමක් හෝ සිදුවී ඇත්නම් එය මා විසින් සිදුවූවකි. මෙහි යම් ප්‍රයෝජනයක් හෝ වටිනාකමක් ඔබ දකින්නේ නම්, ඒ සියල්ලෙහි ප්‍රශංසාව අල්ලාහ්ට පමණක් සතුය.

අල්-හම්දු ලිල්ලාහ්

පරිවර්තක

## 1. දොරවල් වසා දැමීම, නින්දට යෑමට පෙර ගින්දර නිවා දැමීම, භාජන වසා තැබීම හා දරුවන් ගෙයින් බැහැර යෑමෙන් වැළැක්වීම.

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කළ බවට සඳහන් ජාබිර් රළියල්ලාහු අන්හු තුමාණන් විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි මුස්ලිම් යන ග්‍රන්ථවල මෙසේ සඳහන් වේ.

**عَنْ النَّبِيِّ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ إِذَا اسْتَجْنَحَ اللَّيْلُ أَوْ قَالَ جُنْحُ اللَّيْلِ فَكُفُّوا صِبْيَانَكُمْ فَإِنَّ الشَّيَاطِينَ تَنْتَشِرُ حِينَئِذٍ فَإِذَا ذَهَبَ سَاعَةٌ مِنْ الْعِشَاءِ فَخَلُّوهُمْ وَأَغْلِقْ بَابَكَ وَاذْكُرْ اسْمَ اللَّهِ وَأَطْفِئْ مِصْبَاحَكَ وَاذْكُرْ اسْمَ اللَّهِ وَأَوْكِ سِقَاءَكَ وَاذْكُرْ اسْمَ اللَّهِ وَخَمِّرْ إِنَاءَكَ وَاذْكُرْ اسْمَ اللَّهِ وَلَوْ تَعْرُضُ عَلَيْهِ شَيْئًا**

ZZරාත්‍රිය ආරම්භ වන විට ඔබලාගේ දරුවන් (නිවසේ) රඳවා ගන්න. එම වේලාවන්හි ෂෙයිතාන් විසිර යන්නේය. ඉෂා වේලාවෙන් හෝරාවක් ගත වූ විට ඔවුන්ව නිදහස් කරන්න. ඔබගේ දොරටුව වසා දමන්න. අල්ලාහ්ගේ නාමය සිහිපත් කරන්න. ඔබගේ පහන් නිවා දමන්න අල්ලාහ්ගේ නාමය සිහිපත් කරන්න. ඔබගේ භාජන වසා තබන්න. අල්ලාහ්ගේ නාමය සිහිපත් කරන්න. එම (ආවරණ) මත කිසිවක් හරහට තැබූව ද කම් නැත. මුස්ලිම් හි සඳහන් හදීසයක "භාජනය වසා දමන්න." යයි සඳහන් වී ඇත.

බුහාරි ග්‍රන්ථයේ සඳහන් තවත් හදීසයක් මෙසේය.

**خَمِّرُوا الْآنِيَةَ وَأَوْكُوا الْأَسْقِيَةَ وَأَجِيفُوا الْأَبْوَابَ وَاكْفِتُوا صِبْيَانَكُمْ عِنْدَ الْعِشَاءِ فَإِنَّ لِلْجِنِّ انْتِشَارًا وَخَطْفَةً وَأَطْفِئُوا الْمَصَابِيحَ عِنْدَ الرُّقَادِ فَإِنَّ الْفُوَيْسِقَةَ رُبَّمَا اجْتَرَّتْ الْفَتِيلَةَ فَأَحْرَقَتْ أَهْلَ الْبَيْتِ**

ඔබලා භාජන වසා දමන්න. ජල මල්ලෙහි කට බැඳ දමන්න. දොරවල් වසා දමන්න. ඉෂා වේලාවෙහි ඔබලාගේ දරුවන් (එළිමහනේ ගැවසීමෙන්) වළක්වා ගන්න. සැබැවින්ම ( එම වේලාවෙහි) විසිරී යාම හා ගැවසීම ජින් සතු වන්නේය. නින්දට යන විට පහන් නිවා දමන්න. සමහර විටක මීයෙකු (පහන් තිර ඇද ගොස් (නිවසා හා) නිවැසියන් ගිනිබත් කළ හැක.

බුහාරි හා මුස්ලිම් යන ග්‍රන්ථවල සඳහන් තවත් හදීසයක් මෙසේය.

لَا تَتْرُكُوا النَّارَ فِي بُيُوتِكُمْ حِينَ تَنَامُونَ

ඔබලා නින්දට යන විට, ඔබලාගේ නිවැස්වල ගින්දර (දැල්වෙන්නට) ඉඩ නොතබන්න.

බුහාරි හා මුස්ලිම්හි සඳහන් අබූ මූසා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේය.

قَالَ احْتَرَقَ بَيْتٌ بِالْمَدِينَةِ عَلَى أَهْلِهِ مِنْ اللَّيْلِ فَحُدِّثَ بِشَأْنِهِمْ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ إِنَّ هَذِهِ النَّارَ إِنَّمَا هِيَ عَدُوٌّ لَكُمْ فَإِذَا نِمْتُمْ فَأَطْفِئُوهَا عَنْكُمْ

එක් රැයක මදීනාවේ නිවසක්, එහි නිවැසියන් සමග ගිනි බත්විය. ඔවුන්ට අත් වූ මෙම විපත නබි තුමාණන් ට දන්වනු ලැබීය. එවිට එතුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

“සැබැවින්ම මෙම ගින්න, එය නුඹලාගේ සතුරාය. නුඹලා නින්දට යන්නෙහු නම්. නුඹලාගෙන් ඈත්වන පරිදි නුඹලා එය නිවා දමන්න.“

සුනන් අබු දාවූද් හි සඳහන් හදීසයක් මෙසේය.

جَاءَتْ فَأْرَةٌ فَأَخَذَتْ تَجُرُّ الْفَتِيلَةَ فَجَاءَتْ بِهَا فَأَلْقَتْهَا بَيْنَ يَدَيْ رَسُولِ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ عَلَى الْخُمْرَةِ الَّتِي كَانَ قَاعِدًا عَلَيْهَا فَأَحْرَقَتْ مِنْهَا مِثْلَ مَوْضِعِ الدِّرْهَمِ فَقَالَ إِذَا نِمْتُمْ فَأَطْفِئُوا سُرُجَكُمْ فَإِنَّ الشَّيْطَانَ يَدُلُّ مِثْلَ هَذِهِ عَلَى هَذَا فَتُحْرِقَكُمْ

දවසක් මීයෙක් ඇවිලෙන පහන් තිරයක් ඇද ගෙන ගොස් නබි තුමාණන් අසුන්ගෙන සිටි ඇතිරිල්ල මතට දැමීය. (එයින්) දිර්හම් කාසියක තරම්වූ ප්‍රමාණයක් පිළිස්සී ගියේය. එවිට නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ "නුඹලා නින්දට යන්නේ නම්. නුඹලාගේ පහන් නිවා දමන්න. සැබැවින්ම ෂෙයිතාන් මෙයාකාරයෙන් පෙනී සිට නුඹලාව පුළුස්සා දමනු ඇත."

ජාබිර් ( රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත.

لَا تُرْسِلُوا فَوَاشِيَكُمْ وَصِبْيَانَكُمْ إِذَا غَابَتْ الشَّمْسُ حَتَّى تَذْهَبَ فَحْمَةُ الْعِشَاءِ فَإِنَّ الشَّيَاطِينَ تَنْبَعِثُ إِذَا غَابَتْ الشَّمْسُ حَتَّى تَذْهَبَ فَحْمَةُ الْعِشَاءِ

නුඹලාගේ ෆවාෂී නම් ගොවිපලේ සතුන් ද, නුඹලාගේ දරුවන් ද, හිරු අවරට ගොස් ෆහ්මතුල් ඉෂා නම් රාත්‍රි අඳුර පැතර යන තෙක් (එළිමහනේ) නොයවන්න. සැබැවින්ම ෂෙයිතාන් හිරු අවරට ගොස් රාත්‍රි අඳුර පැතිරෙන තෙක් වූ කාලයේ පිටවන්නේය.

ඉමාම් නවවි තුමාණන් මෙම හදීසය විග්‍රහ කර ඇත්තේ මෙසේය.

අල්-ෆවාෂී යනු ඔටු, ගව, එළු හා මේ හැර සෙසු සතුන් වැනි ආර්ථික සම්පත් හා සම්බන්ධ සියලූ දෑය. අල්-ෆවාෂී යනු ෆාෂියා නම් වදනෙහි බහු වචනයයි. එනම්, ව්‍යාප්ත වී යාම යන අර්ථය ගෙන

දෙන්නේය. මෙම සතුන්ට මෙම වචනය යොදා ඇත්තේ උන් මහපොළොවේ ව්‍යාප්තව ජීවත් වන හෙයිනි.

ෆහ්මතුල් ඉෂා යනු ඉෂා වේලාවෙහි අන්ධකාරයයි. එහි කළුවරයි. සමහර විග්‍රහකයින් මෙය රාත්‍රියේ උදාව, එහි අඳුරේ ආරම්භය යනුවෙන් ද පවසා ඇත. තවත් සමහරුන්ගේ මතය වන්නේ මෙය මග්රිබ් හා ඉෂා සලාතය අතර වූ කාලය යන්නත් ඉෂා සලාතය හා අළුයම උදාව අතර වූ කාලය යන්නත් වේ.

ඉබ්නු දකීක් අල්-ඊද් නම් විද්වතා පවසා සිටිනුයේ, “මෙම නියෝගයන් අනිවාර්ය කරුණු නොවන අතර මේවා තමන්ගේ අරමුණු අනුව වෙනස් වන්නේය. ඒවායින් සමහරක් සුන්නාහ් නම් තත්ත්වයේ පවතී. එනම් සෑම මොහොතකම බිස්මි පැවසීම. තවත් සමහරක් සුන්නාහ් හා මඟපෙන්වීමක් වශයෙන් පවතී. උදාහරණයක් වශයෙන්, ෂෙයිතාන් වැසී ඇති දොරවල් විවෘත නොකරන බැවින් ආරක්ෂාව උදෙසා දොරවල් වසා දැමීම. මෙහි දී භෞතික වශයෙන් ආරක්ෂාව ලැබෙනවාත් මෙන්ම ෂෙයිතාන්ගේ ගැවසීමෙන් ආරක්ෂාව ද ලැබෙන්නේය. ජල මළුවල කට බැඳ තැබීම හා භාජන වසා තැබීම ද එලෙසයමය.

තවදුරටත් එතුමා මෙසේ ප්‍රකාශ කර සිටියි. එනම්,

දොරවල් වසා දැමීමේ නියෝගය වනාහි එහි ආධ්‍යාත්මික යහපත මෙන්ම සොර සතුරන්ගෙන්, කලහකාරීන්ගෙන් ජීවිත, දේපල, ආරක්ෂා කර ගැනීම වැනි ලෞකික යහපත ද ඇත්තේය. විශේෂයෙන්ම ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව ද ලැබෙනු ඇත.

මේ කාලය තුළ දරුවන් එළිමහනේ නොයවන මෙන් වූ නියෝගය කර ඇත්තේ, රාත්‍රිය නපුරු බලවේගයන් ඒකරාශී වීමට සුදුසුම වේලාව බැවිනි. රාත්‍රිය ආරම්භයේ ෂෙයිතානුන් විසිරී යන විට

උන්ගෙන් ඇතිවන්නා වූ හානිය දරුවන් කෙරෙහි බලපා ඔවුන් බියට පතවන්නට අවස්ථාව ඇති හෙයිනි.

එමෙන්ම භාජන වසා තැබීම ද ඉතා වැදගත් කරුණක් වෙයි. මෙකල විශාල භාජනය ලෙස සැළකෙන්නේ ශීතකරණයයි. ආහාර බඳුන් වසා නොතැබූවත් ඒවා ශීතකරණයේ දමා එය වසා දැමීම එම නීතියට අදාළ වන්නේය. මේ අනුව අල්ලාහ්ගේ නාමය සිහිපත් කරමින් එය වැසිය යුතුයි.

## 2. නිවසට ඇතුල්වන විට බිස්මි පවසා ඇතුල්වීම.

මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කළ බවට ජාබිර් ( රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ.

**إِذَا دَخَلَ الرَّجُلُ بَيْتَهُ فَذَكَرَ اللَّهَ عِنْدَ دُخُولِهِ وَعِنْدَ طَعَامِهِ قَالَ الشَّيْطَانُ لَا مَبِيتَ لَكُمْ وَلَا عَشَاءَ وَإِذَا دَخَلَ فَلَمْ يَذْكُرْ اللَّهَ عِنْدَ دُخُولِهِ قَالَ الشَّيْطَانُ أَدْرَكْتُمْ الْمَبِيتَ وَإِذَا لَمْ يَذْكُرْ اللَّهَ عِنْدَ طَعَامِهِ قَالَ أَدْرَكْتُمْ الْمَبِيتَ وَالْعَشَاءَ**

මිනිසෙක් තම නිවසට ඇතුලු වන විට, ඔහු ඇතුලු වන අවස්ථාවේ සහ ඔහුගේ ආහාර ගන්නා අවස්ථාවේ අල්ලාහ්ව සිහිපත් කරන්නේ නම්, ෂෙයිතාන් (තම සගයින් අමතා අද) නුඹලාට නවාතැන් නැත. රාත්‍රි ආහාරය ද නැත යැයි පවසයි. ඇතුලු වන අවස්ථාවේ දී අල්ලාහ්ගේ නාමය සිහිපත් නොකරමින් කෙනෙක් ඇතුලු වන්නේ නම්, ෂෙයිතාන්, නුඹලාට රාත්‍රී නවාතැන ලැබී ඇතැයි පවසයි. ආහාර ගන්නා අවස්ථාවේ අල්ලාහ්ව සිහිපත් නොකළේ නම්

ෂෙයිතාන් නුඹලාට රාත්‍රී නවාතැන ද රාත්‍රී ආහාර ද ලැබී ඇතැයි පවසයි.

නිවසට ඇතුළු වන විට බිස්මි පැවසීම, ලා ඉලාහ ඉල්ලල්ලාහු වැනි වදන් තුළින් අල්ලාහ්ව සිහිපත් කිරීම වැදගත් වේ.

මාලික් ඉබ්නු අල්-අෂ්අරී රළියල්ලාහු අන්හු තුමාණන් විසින් වාර්තා කරන හදීසයක් අබූ දාවූද් හි මෙසේ සඳහන් වේ.

**إِذَا وَلَجَ الرَّجُلُ بَيْتَهُ فَلْيَقُلْ اللَّهُمَّ إِنِّي أَسْأَلُكَ خَيْرَ الْمَوْلَجِ وَخَيْرَ الْمَخْرَجِ بِسْمِ اللَّهِ وَلَجْنَا وَبِسْمِ اللَّهِ خَرَجْنَا وَعَلَى اللَّهِ رَبِّنَا تَوَكَّلْنَا ثُمَّ لِيُسَلِّمْ عَلَى أَهْلِهِ**

මිනිසෙක් තම නිවසට පිවිසන විට ඔහු “අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හෘයිරල් මව්ලජි ව හෘයිරල් මහෘරජි බිස්මිල්ලාහි වලජ්නා වබිස්මිල්ලාහි හෘරජ්නා වඅලල්ලාහි රබ්බිනා තවක්කල්නා.“ යනුවෙන් පවසා, ඉන් අනතුරුව නිවසේ අයට සලාම් පැවසිය යුතුයි.

තේරුම: යා අල්ලාහ්, පිවිසෙන ස්ථානයේ යහපත ද පිටවන ස්ථානයේ යහපත ද මම ඔබෙන් පතමි. අපි අල්ලාහ්ගේ නාමයෙන් පිවිසුනෙමු. අල්ලාහ්ගේ නාමයෙන් පිටත්ව යන්නෙමු. අපගේ පරමාධිපති කෙරෙහි සියල්ල අපි භාර කළෙමු. යැයි පවසා අනතුරුව නිවසේ අයට සලාම් පැවසිය යුතුයි.

# 3. නිවසට ඇතුල්වන විට කට පිරිසිදු කිරීම

අන් සියල්ලටම පෙර නිවසට ඇතුලූ වන විට දත් මැද පිරිසිදු කිරීම ඉතා වැදගත් වන්නේය.

ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ.

أَنَّ النَّبِيَّ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ كَانَ إِذَا دَخَلَ بَيْتَهُ بَدَأَ بِالسِّوَاكِ

නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් තම නිවසට ඇතුළු වන විට කට පිරිසිදු කිරීමට පටන් ගනී.

## 4. නිවසෙහි සලාතය ඉටු කිරීම.

ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීස

**قَالَ رَسُولُ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ اجْعَلُوا فِي بُيُوتِكُمْ مِنْ صَلَاتِكُمْ وَلَا تَتَّخِذُوهَا قُبُورًا**

නුඹලාගේ නිවැස්හි සලාතය ඉටු කරන්න. ඒවා සොහොන් බවට පත්කර නොගන්නැයි අල්ලාහ්ගේ ධර්ම ¥තයාණන් ප්රකාශ කළහ.

ජාබිර් රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ සඳහන් වේ.

නුඹලාගෙන් කෙනෙකු මස්ජිදයේ සලාතය ඉටු කළේ නම්, එම සලාතයේ කොටසක් තම නිවසෙහි ඉටු කරත්වා. තම නිවසේ තමන් කරන සලාතය හේතුවෙන් අල්ලාහ් යහපත තබන්නේය.

## 5. නිවසෙහි රූපරාමු හෝ ප්රතිමා වැනි යමක් තැබීමෙන් වැළකිය යුතුයි.

අබූ තල්හා රළියල්ලාහු අන්හු තුමා විසින්, වාර්තා කළ හදීසයක් බුහාරි මුස්ලිම් හි මෙසේ සඳහන් වේ.

إِنَّ رَسُولَ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ إِنَّ الْمَلَائِكَةَ لَا تَدْخُلُ بَيْتًا فِيهِ الصُّورَةُ

"සැබැවින්ම කවර නිවසෙහි රූපරාමු ඇත්තේ ද එවන් නිවසට මලක්වරු ඇතුළු නොවන්නේයැ"යි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කළේය.

බුහාරි හි සඳහන් තවත් හදීසයක, ප්‍රතිරූවා තිබෙන නිවෙස්වලට ද ඇතුළු නොවන බව සඳහන් වී ඇත.

අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්ථා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ සඳහන් වේ.

لَا تَدْخُلُ الْمَلَائِكَةُ بَيْتًا فِيهِ تَمَاثِيْلٌ أَوْ تَصَاوِيْرٌ

"කවර නිවසක ප්‍රතිමාවක් හෝ පින්තූරයක් තිබෙන්නේ ද එවන් නිවසකට මලක්වරු ඇතුළු නොවන්නේය යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කළහ.

ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය හා ඉබ්නු උමර් තුමා වාර්තා කළ මෙවැනිම හදීස් බොහෝමයක් බුහාරි හි සඳහන්ව ඇත. මෙම හදීස්වලින් අවදාරණය කරන සමහර කරුණු පහත ඉදිරිපත් කරන්නෙමු.

- සමාජයේ ප්‍රසිද්ධ අයගේ පින්තූරු, මංගල පින්තූරු, නායකයින්ගේ පින්තූරු, මුතුන්මිත්තන්ගේ පින්තූරු වැනි දෑ එල්ලා තැබීමෙන් වැළකිය යුතුයි. එය මතක සටහනක් ලෙස එල්ලා තිබුන ද තහනම් වන්නේය.
- ඇතිරිලි හා කොට්ට උරවල එසේ රූප යෙදීම ද සුදුසු නොවන්නේය. වෘත්තීමය කටයුත්තක් සඳහා යොදා ඇත්නම්

එය වරදක් නොවන්නේය. වියළි ආහාර, කිරි පැකට්ටුවෙහි යොදා ඇති පින්තූර, වෙළඳ දැන්වීම් යටතට අන්තර්ගත වන්නේය. එමෙන්ම යම් කිසි අවශ්‍යතාවයක් සඳහා හෝ බලකිරීමක් නිසා භාවිතා කළ හැක.

- සත්ව හමින් සකස් කරන ලද සත්ව පිළිරුව. මේවා පරිහරණය කිරීමට අනුමත නැත. ෂෙයික් බින් බාස් තුමාණන් මෙය කරුණු තුනක් යටතේ තහනම් කර ඇත.
  - නාස්තිය.
  - තවද එහි (3D) හැඩරුවකින් යුත් හමින් සාදන ලද පිළිරුවක් තිබීම.
  - තවද සමහර ජනයා ඒවායෙහි ගුණාංග හා හැසිරීම අනුගමනය කිරීමට පෙළඹීම.

මෙම පින්තූරු හා ප්‍රතිමාවල සැලකිල්ලට භාජනය වනුයේ ඒවායෙහි මුහුණුය. මේ නිසා ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා මෙසේ පැවසුවේය. හිස ඇති පිළිරුවක් තිබේ නම්, ඒවායෙහි හිස ඉවත් කළ විට ඒවා රූපයක් නොවන්නේය.)

## 6. නිවසෙහි සුනඛයන් ගැවසීමට ඉඩ නොතැබීම හා ඔවුන් ඇති කිරීමෙන් වැළකීම.

අබූ තල්හා රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මෙසේ වාර්තා වේ.

لَا تَدْخُلُ الْمَلَائِكَةُ بَيْتًا فِيهِ كَلْبٌ وَلَا تَصَاوِيرُ

කවර නිවසක බල්ලන් හෝ ප්‍රතිමා තිබේ ද එම නිවසට මලක්වරුන් ඇතුළු නොවන්නේය.

ඉබ්නු උමර් තුමා ද මේ අයුරින්ම වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මුස්ලිම් හි සඳහන් අබූ හුරෙයිරා තුමා වාර්තා කළ හදීසයක කවර නිවසක බල්ලන් හෝ සීනු තිබේ ද එම නිවසට මලක්වරුන් ඇතුළු නොවන්නේ යැයි සඳහන් වී ඇත.

අබූ හුරෙයිරා හා ඉබ්නු උමර් තුමා යන අය විසින් වාර්තා කළ හදීසයක, කවරෙකු වගා ආරක්ෂාවට, ගමනට හෝ දඩයමට පුහුණු කරන ලද සුනඛයින් හැර වෙනත් සුනඛයින් ඇති කරන්නේ ද සෑම දිනකම ඔහුගේ ප්‍රතිඵල කීරාත් දෙකක ප්‍රමාණයකින් අඩු වන්නේය.

කීරාත් යනු එක් දිනක තමන් ලබන්නා වූ කුසල් අතුරින් නියමිත කුසල් ප්‍රමාණයකි. සමහර විට එය කුසල් විස්සක් විය හැකිය. එසේ නොමැති නම් විසි හතරක් විය හැකිය. එසේ ද නොමැති නම් මේ හැර වෙනත් ප්‍රමාණයක් ද විය හැකිය. කෙසේ වෙතත් සෑම දිනකම ඔහුගේ කුසල් අඩු වන්නේය.

මෙහි කීරාත් යනුවෙන් සඳහන් වනුයේ ජනාසාzවක සඳහන් කීරාත් ප්‍රමාණය යැයි ද, ඒ දෙකම එක හා සමාන යැයි ද සඳහන් වී ඇති නමුත් ජනාසාzවක් සම්බන්ධයෙන් සැළකූ විට එය මහිමයන්ගෙන් යුත් කටයුත්තක් නිසා ඒ අනුව එය අති මහත් බවත්, මෙහි දී දඬුවම් ලැබිය හැකි වරදක් නිසා ද මහිමයන්ගෙන් යුත් කටයුත්තක් නිසා ද එය සෙසු දෑට වඩා අති විශාල බව සඳහන් වේ.

මෙහි දී මම ප්‍රකාශ කර සිටිනුයේ ජනාසාවක කීරාත් යනු මහා කන්දක් හෝ උහද් කන්ද හෝ උහද් කන්දට වඩා විශාල එකක් වන බවයි.

හදීස්වල සඳහන් පරිදි ලබා ගත හැකි පාඩම.

1. සුනකයින් ඇති කිරීමේ තහනම.

2. සීනු නාද කිරීමේ තහනම: නිවසට සවිකර ඇති සීනුව මෙයට අදාළ නොවන අතර එය නිවැසියන්ගේ අවශ්‍යතාව සඳහා සවිකර ඇත්තකි. එමෙන්ම දුරකතන, වාහන සඳහා භාවිතා කර ඇති සංඥා හා ආරක්ෂක සීනු ද මෙයට අදාළ නොවන්නේය.

3. කිසිදු අත්‍යවශ්‍ය හේතුවකින් තොරව සුනඛයින් ඇති දැඩි කිරීමෙන් අප සතු කුසල් කර්මකර්මයෙන් නැති වී යන්නේය. එමෙන්ම ජනාසාzවක විවිධ කටයුතු වලට සහභාගී වීම හෝ ඉන් සමහර කටයුතු වලට පමණක් සහභාගී වීම තුළින් සහභාගී වීම අනුව කුසල්වල තරාතිරම් පිහිටනු ඇත.

4. කිසිදු අත්‍යවශ්‍යතාවයකින් තොරව සුනඛයින් ඇති දැඩි කිරීම කුෆ්රයට එනම් දේව ප්‍රතික්ෂේපයට සමාන වන්නේය.

## 7. කුරුසයක් හෝ කුරුස සළකුණු ඇති දෑ නිවසෙහි තබා ගැනීමෙන් වැළකීම.

ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරිහි මෙසේ සඳහන් වී ඇත.

**أَنَّ النَّبِيَّ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ لَمْ يَكُنْ يَتْرُكُ فِي بَيْتِهِ شَيْئًا فِيهِ تَصَالِيبُ إِلَّا نَقَضَهُ**

නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් කුරුස සහිත කිසිවක් තම නිවසෙහි දුටු විට එය විනාශ කර නොදමා අත හැරියේ නැත.

## 8. කොටි හම් වැනි කැලෑ සතුන්ගේ හම් එල්ලා තැබීමෙන් හෝ එය ඇතිරිලි වශයෙන් භාවිතා කිරීමෙන් හෝ ඒවා මත වාඩි වී ගමන් කිරීමෙන් වැළකීම.

මේ පිළිබඳව හදීස් බොහෝමයක් සඳහන්ව ඇත. ඒවා අතුරින් අල්-මික්දාද් බින් මෑදී කරීබ් තුමාණන් විසින් වාර්තා කළ හදීසය මෙසේය. වන සතුන්ගේ හම් භාවිතා කිරීමෙන් හා ඒ මත අසුන් ගෙන යාමෙන් නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් වැළැක්වූහ. මූලාශ්‍රය: අහ්මද්, අබූ දාවූද්, අන්-නසාඊ.

මුආවියා රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේය. කොටි හම් පිළිබඳව එනම් එහි මත අසුන් ගෙන වාඩිවීම තහනම් කළේය. තවත් වදනක නුඹලා මුගටි හෝ කොටි හම් මත හෝ අසුන්ගෙන ගමන් නොකරනු. මූලාශ්‍රය අහ්මද්, අබූ දාවූද්.

අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මෙසේය. කවර තැනක කොටිහම් ඇත්තේ ද එහි මලක්වරුන් මිත්‍රකම් නොපවත්වන්නේය. මූලාශ්‍රය අබූ දාවූද්

අබූ මලීහ් රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මෙසේය. වන සතුන්ගේ හම් පරිහරනයෙන් නබිතුමාණෝ වැළැක්වූහ. මූලාශ්‍රය තිර්මිදි, අබූ දාවූද්

අලී රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මෙසේය. අල්ලාහ්ගේ දූතයාණෝ මුගටි හම් පරිහරනය කිරීමෙන් ද ඒ මත අසුනෘ ගැනීමෙන් ද ඒ මත වාඩිවී ගමන් කිරීමෙන් ද වැළැක්වූහ. තවද කොටි හම් පරිහරණය කිරීමෙන් ද ඒ මත අසුන් ගැනීමෙන් ද ඒ

මත වාඩි වී ගමන් කිරීමෙන් ද වැළැක්වූහ. මූලාශ්‍රය අබ්දුර් රස්සාක්, අත්-තහාවි යන අය විසිනි.

මෙම හදීස් එකතුවෙන් කොටිහම් භාවිතය කිසිදු සැකයකින් තොරව සම්පූර්ණයෙන් තහනම් බව පැහැදිලි වන්නේය. මේ පිළිබඳව අබූ හුරෙයිරා හා මික්දාද් රළියල්ලාහු අන්හුමා යන අයගේ හදීස් ප්‍රමාණවත් වන්නේය. එමෙන්ම බිත්ති අලංකාරය කිරීමට ඒවා එල්ලා තැබීම ද සුදුසු නොවන්නේය.

කොටිහම් උපයෝගි කිරීම හා ඒ මත වාඩිවී ගමන් කිරීම තහනම් කිරීමට හේතුව.

ඉබ්නු කය්යුම් හා ශේය්ක් බින් බාස් රහිමහුමුල්ලාහ් පවසන පරිදි එම සතුන් ළග ඇති නපුරු ගුණාංගයන් මිනිසුන්ට ද බලපාන බැවිනි. එමෙන්ම මේවා පදම් කිරීමෙන් පිරිසිදු නොවන බවද සඳහන් වී ඇත. මෙය සත්‍යයක් වුව ද මෙහි තහනමට හේතුවක් නොවන්නේය. තවත් තැනක මේ තුළ අහංකාරය පවතින බව සඳහන් වී ඇත. එමෙන්ම අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමාගේ හදීසයේ සඳහන් වන පරිදි මලක්වරුන් දුරස් වීමට මෙය කාරණයක් වන්නේය. පොදුවේ වල් සතුන්ගේ හම් පිළිබඳව නීතිය ද මෙම නීතියමය. මේ ගැන සඳහන් වූ හදීස් කිහිපයක් ද ඇත්තේය.

## 9. සංගීත භාණ්ඩ නිවසේ තබා ගැනීම හා ඒවා භාවිතා කිරීමෙන් වැළකීම. මේවා සියල්ල තහනම් කරන ලද දෑය. එමෙන්ම මනස විකෘති කරන දෑ භාවිතා කිරීම ද තහනම්ය.

මේවා අතුරින් සංදේශන මාධ්‍යයක් වශයෙන් අල්ලාහ් දායාද කළ දුරකථනය උපයෝගි කිරිම පිළිබඳව අවදානය යොමු කළ යුතුයි.

මෙයින් ප්‍රයෝජනය ලබන්නේ නම් එය විශාල භාග්‍යයකි. එය අයහපත් දෙයකට භාවිතා කරන්නේ නම් හෝ එයින් ඇතිවන යම් අයහපත් ප්‍රතිවිපාක පිළිබඳව නොසලකා හරින්නේ නම් විනාශයට පත් වන්නේය. සමහරු, මහ්රම් අජ්නබී යන ඉස්ලාමීය සීමාවන් පිළිබඳව අවබෝධයකින් තොරව දුරකතනයෙන් කතා කරති. ඒ සඳහා පිළිතුරු ද දෙති. මෙය පැහැදිලි වරදකි. හැකි සෑම මොහොතකම, ලැබෙන දුරකථන ඇමතුමට පිළිතුරු දීමේ වගකීම පැවරී ඇත්තේ වැඩිහිටි පිරිමි පාර්ශවයටය. ලබන ඇමතුම්වලට පිරිමින් සිටිය දී කාන්තාවන් පිළිතුරු දීම සුදුසු යැයි කිව නොහැක. මෙම කරුණු පිරිමින් සතු වගකීමකි. තම පවුල ආරක්ෂා කිරීම, ඔවුන් පිළිබඳව නිතර අවදියෙන් සිටීම, ආගමික පරිසරයක් ගොඩ නැගීම ඔවුන් සතු වගකීමකි.

# 10. වැසිකිලි, කැසිකිලි භාවිතා කරන අවස්ථා වන්හි කිබ්ලා දෙසට මුහුණ පෑමෙන් හා පසුපස ලෑමෙන් වැළකීම.

අබූ අය්යූබ් රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේය. නුඹලා කැසිකිලි අවශ්‍යතා සඳහා යන්නේ නම්. කිබ්ලා දිසාවට නොහැරෙනු. තවද එයට පිටුපසලා නොසිටිනු. එහෙත් බටහිර දිසාවට හෝ නැගෙනහිර දිසාවට හෝ හැරී සිටිනු. මෙවන් වාර්තාවක් අබූ හුරෙයිරා තුමා හා සල්මාන් ෆාරිසී රළියල්ලාහු අන්හුමා යන අය විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි සඳහන් වී ඇත.

මේ සම්බන්ධයෙන් බහුතර මතය වනුයේ ගොඩනැගිල්ලක් තුළ හා එළිමහනක් අතර වෙනසක් පවතින බවයි. ගොඩනැගිල්ලක තම කැසිකිලි අවශ්‍යතා ඉටු කිරීමේ දී කිබ්ලා දිසාවට මුහුණ ලෑම හෝ

පසුපස ලෑම වරදක් නොවන අතර එළිමහනක මෙසේ කටයුතු කිරීම සුදුසු කාර්යයක් නොවන්නේය. එහෙත් ගොඩනැගිල්ලක පවා එසේ කිබ්ලා දිසාවට මුහුණ ලෑමෙන් හෝ පසුපස ලෑමෙන් වැළකී සිටීම යෝග්‍යවේ. ෂෙයිහුල් ඉස්ලාම් හා ඉබ්නු කය්යූම් යන විද්වතුන් පවසා සිටින්නේ පොදුවේ මෙය තහනම් බවයි. නමුත් බින් බාස් තුමාගේ මතය වනුයේ ගොඩනැගිල්ලක පවා මෙසේ සිදු කිරීමෙන් වැළකීම උතුම් බවයි. එමෙන්ම ෂෙයික් උතෙයිමීන්ගේ මතය ගොඩනැගිල්ලක මුහුණ ලෑම හා පසුපස ලෑම අතර වෙනසක් පවතින බවයි. එතුමා තවදුරටත් අවධාරණය කරනුයේ බුහාරි හා මුස්ලිම් යන ග්‍රන්ථවල සඳහන් ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමාගේ හදීසය අනුව එහි දී කිබ්ලාවට මුහුණ ලෑම තහනම් බවත් පසුපස ලෑම වරදක් නොවන බවත්ය.

## 11 රන් රිදී භාණ්ඩ භාවිතයෙන් වැළකී සිටීම

ආහාර පාන ගැනීමෙහි මෙන්ම වුළු ගැනීම වැනි කටයුතු සඳහා රන් රදී භාණ්ඩ භාවිතා කිරීම තහනම් වේ. බුහාරි සහ මුස්ලිම් හි සඳහන් උම්මු සලමා ( රළියල්ලාහු අන්හා) තුමිය වාර්තා කළ හදීසයක් මෙසේය. රිදී භාජනවල පානය කරන්නා, ඔහු තම කුස පුරවා ගනුයේ නිරයේ ගින්නෙන්ය. මුස්ලිම් හි මීට අමතරව, රන් භාජන යනුවෙන් ද ආහාර ගැනීම යනුවෙන් ද සඳහන් වී ඇත. එනම් කවරෙකු රන් හෝ රිදී භාජනවල ආහාර පාන ගන්නේ ද ඔහුගේ කුස පුරවා ගනුයේ ගින්නෙනි යන්නයි.

තවත් හදීසයක වාර්තා වනුයේ මෙසේය. සැබැවින්ම මේවා මෙලොවෙහි (දේව ප්‍රතික්ෂේපිතවුන්ට) ඔවුනට ලැබෙන දෑය නුඹලාට පරලොවෙහි ඇත.

# 12. නිවසකට පිවිසෙන්නා නිවැසියන්ගෙන් අවසර පැතීම

අබූ මූසා රළියල්ලාහු අන්හු තුමා ප්‍රකාශ කළ හදීසයක් මුස්ලිම් ග්‍රන්ථයේ සඳහන් වන්නේ මෙසේය. අවසරය පැතීම වාර තුනකි. ඔබට අවසර දුන්නේ නම් - එය පිළිගනු. එසේ නොමැතිනම්, ආපසු හැරී එනු. තුන්වරක් අවසර පැතුවායින් පසු නැවත නැවතත් අවසර ඉල්ලා සිටීම නොසුදුසුය. එය නිවැසියන් අසීරුතාවයට පත් කරවන බැවිනි. යම් කිසි හේතුවක් මත ඔබේ පැමිණීම ඔවුන් දැන සිටිය ද, ඔබට එහි පිවිසීමට අවසර නොදීමට හේතු තිබිය හැක. ඔවුන් දැන හෝ නොදැන සිටියත් තුන්වරක් අවසර පැතීම ඉතා වැදගත් වන්නේය. ඔවුන් ආපසු හැරී යන මෙන් පැවසූ විට නැවතත් අවසර පැතීම තහනම්ය. උත්තරීතර අල්ලාහ් අල්-කුර්ආනයේ මෙසේ පවසයි.

*නුඹලා ආපසු හැරී යනුයි නුඹලාට පවසනු ලැබුවේ නම් නුඹලා ආපසු හැරී යනු. එය නුඹලාට ඉතා පිවිතුරුය. නුඹලා කරමින් සිටි දෑ පිළිබඳව ඔහු සර්වඥානීය.* අල්-කුර්ආන් 24 : 28

නිවසේ අයට ඇමතිමෙන් හෝ දොරට තට්ටු කිරීමෙන් හෝ සීනුව නාද කිරීමෙන් හෝ අවසරය පැතිය හැකිය.

සමීප ඥාතීන්ට හෝ නිවැසියන්ගෙන් ඇතමෙකු ඇතමෙකුට අවසර පැතීමේ ක්‍රමය අල්ලාහ් අල්-කුර්ආනයේ මෙසේ සඳහන් කරයි.

විශ්වාස කළවුනි, නුඹලාගේ දකුණත් අයිතිකරගත් අය ද නුඹලා අතුරින් වැඩිවියට නොපැමිණි අය ද (නිවසට ඇතුලුවීමට) තුන් වරක් නුඹලාගෙන් අවසර ලබාගත යුතුය. (එනම්) ෆජ්ර් සලාත යට පෙර ද මධ්‍යහ්න ( උණුසුම හේතු කොටගෙන) නුඹලා නුඹලාගේ වස්ත්‍ර

උනා දමන වේලාවන්හි ද ඉෂා සලාතයෙන් පසුව ද, මෙය (වස්ත්‍ර උනා දමන) වේලාව නුඹලාගේ පෞද්ගලික අවස්ථා තුනය. එයින් පසුව (අවසර නැතිව හමුවීම) නුඹලාට ද ඔවුනට ද වරදක් නැත. (එය) නුඹලාගෙන් ඇතැමකුගෙන් ඇතැමකු වරින් වර හමුවන අය නිසාය. මෙලෙසය, අල්ලාහ් නුඹලාට ආයාත් (වදන්) පැහැදිලි කරනුයේ. අල්ලාහ් සර්වඥය. සර්ව ප්‍රාඥය. අල්-කුර්ආන් 24 : 58.

නිවසේ මෙහෙකරුවන් හා අවබෝධවන වයසේ පසුවන දරුවන් මෙම වේලාවන්හි අවසරයකින් තොරව ඇතුල් වීමෙන් වැළකී සිටින මෙන් අණ කරනු ලැබේ.

වැඩිවියට පත්වූ අය, ඔවුන් සෑම මොහොතකම අවසර ඉල්ලා සිටිය යුතුයි. අතා ඉබ්නු යසාර් තුමා විසින් වාර්තා කළ හදීසයක් මාලික් තුමා මෙසේ ප්‍රකාශ කරයි.

අල්ලාහ්ගේ දූතයාණනි! මගේ මවගෙන් පවා මම අවසර පැතිය යුතුදැයි මිනිසෙක් අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් විමසුවේය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ ඇයගෙන් ඔබ අවසර පැතිය යුතු යැයි ප්‍රකාශ කළහ. එවිට එම මිනිසා මම ඇයගේ සාත්තුකාරයා වෙමි යැයි පැවසුවේය. එවිට නබි තුමාණෝ ඇයගෙන් ඔබ අවසර පැතිය යුතුයි. ඇය සැරසුමක් නොමැතිව සිටිනු දකින්නට ඔබ කැමතිවන්නේදැයි විමසුවේය. එයට ඔහු නැත යනු පිළිතුරු දුන්නේය. එසේ නම් ඇයගෙන් අවසර පතන්නැයි අල්ලාහ්ගේ දූතයාණන් පැවසුවේය.

## 13. අවශ්‍යතාවයක් නොමැතිව බිත්ති ආවරණය කිරීමෙන් වැළකීම.

ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් බිත්ති ආවරණයක් දැක එය ඉරා දමා මෙසේ ප්‍රකාශ කළේය. සැබැවින්ම අල්ලාහ් ගල් හා මැටි ආවරණය කිරීමට අපට අණ කළේ නැත.

අධික උෂ්ණයෙන් හා අධික සීතලෙන් ආරක්ෂාවීම පිණිස එසේ බිත්ති ආවරණය කිරීමට අනුමැතිය ඇතැයි අබූ මුහම්මද් තුමා ප්‍රකාශ කළේය. එමෙන්ම ලැලි බිත්ති වැනි හිඩැස් ඇති බිත්තියක්, රෙද්දකින් ආවරණය කිරීම වරදක් නැත. අවශ්‍ය නොමැති තැන එසේ ආවරණය කිරීම නාස්තියකි. සමකාලීන විද්වතෙකු වූ බින් බාස් තුමාණන් ප්‍රකාශ කර සිටින්නේ එසේ බිත්ති ආවරණය කිරීම පිළිකුල් සහගත ක්‍රියාවකි. හේතුව එය නාස්තියකි. අවශ්‍යතාවයක් නොමැත්තකි. නමුත් ජනෙල් හෝ දොරවල් එසේ වසා තැබීම වරදක් නොවන්නේය.

## 14. ආගන්තුකයින් සඳහා අවශ්‍ය දෑ තබා ගැනීම

ආගන්තුකයින් සඳහා අවශ්‍ය ඇඳුම්, තුවා, ඇඳ, ඇතිරිලි වැනි දෑ සූදානම් කර තැබීම වරදක් නොවේ. එහෙත් අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්ත්ව හෝ අපතේ යන අයුරින් තබා ගැනීම නොසුදුසුය. නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන් ප්‍රකාශ කළ බව ජාබිර් රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. එක් නිදියහනක් මිනිසෙකුට ද තවත් නිදියහනක් ස්ත්‍රියකට ද වේ. තුන්වැන්න ආගන්තුකයාටය. සිව්වැන්න ෂෙයිතාන්ටය.

## 15 ආහාර පානවල නාස්තියෙන් වැළකීම.

උත්තරීතර අල්ලාහ් අල්-කුර්ආන් 7 : 31 වැනි වාක්‍යයේ මෙසේ ප්‍රකාශ කරයි. නුඹලා අනුභව කරන්න. තවද පානය කරන්න. නමුත් නාස්ති නොකරන්න. සැබැවින්ම ඔහු ( අල්ලාහ්) නාස්තිකාරයින්ව ප්‍රිය නොකරන්නේය.

එමෙන්ම අල්-කුර්ආන් 17: 26, 27 වැනි වාක්‍යයන්හී මෙසේ සඳහන් වෙයි.

26. නුඹගේ මුදල් අනවශ්‍ය ලෙස නාස්ති නොකරන්න.

27. නියත වශයෙන්ම නාස්තිකාරයෝ ෂෙයිතාන්ගේ සහෝදරයෝ වෙති. ෂෙයිතාන් ඔහුගේ රබ් (පරමාධිපති)ට අකෘතඥය.

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බවට අම්ර් ඉබ්නු ෂුඅයිබ් රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් අහ්මද්, නසාර්, ඉබ්නු මාජා හා වෙනත් හදීස් ග්‍රන්ථවල මෙසේ සඳහන් වේ. නුඹලා එහි නාස්තිය හා ආඩම්භරය මිශ්‍ර නොවූ දෑ අනුභව කරන්න. පානය කරන්න. පරිත්‍යාග කරන්න. තවද ඇඳ පළඳින්න.

නමුත් අද සමාජයේ ඉතිරි වී ඉවත දමන විශාල ප්‍රමාණයේ ආහාර, පාන කැලිකසල ගොඩේ හෝ කුණු කූඩයන් හී දකින්නට ඇත. මෙලෙස ආහාර ඉවත දැමීම අල්ලාහ්ගේ ආශිර්වාදයට අපහාස කිරීමකි. ආශිර්වාදයට අපහාස කිරීමක් යනු එය ආශිර්වාදය දුන් අල්ලාහ්ට අපහාස කිරීමකි. ධර්ම දූතයන්ගේ නායක මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාගේ මඟ අනුගමනය කිරීම මුස්ලිම්වරුන් කෙරෙහි පැවරුනු වගකීමකි. එතුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. “එක් අයකුගේ ආහාරය දෙදෙනෙකුට ප්‍රමාණවත් වන්නේය. දෙදෙනෙකුගේ ආහාරය සිව් දෙනෙකුට ප්‍රමාණවත් වන්නේය. සිව් දෙනෙකුගේ ආහාරය අට දෙනෙකුට ප්‍රමාණවත් වන්නේය.“ මුස්ලිම්.

කෙනෙක් පිඟානයට බෙදා ගන්නා ආහාර, තමන්ට කෑ හැකි ප්‍රමාණය විය යුතු අතර, ඉතිරිවුයේ නම් ඒවා කුණු කූඩයට නොදමා ශීතකරණයක දමා, තවත් වේලකට උපයෝගි කිරීමට හෝ කුසගින්නෙන් පෙළෙන ජනයා සොයා බලා ඔවුනට ආහාර වේලක් ලබා දිය යුතුයි. ටික කාලයක් තබා ගැනීමට හෝ දුප්පත් අයට පරිත්‍යාග කිරීමට හෝ නොහැකි අවස්ථාවක සතුන්ට වුවද ආහාර වශයෙන් දිය යුතුයි. එය ද කළ නොහැකි නම් ඒවා පිරිසිදු ස්ථානයක දැමිය යුතුයි. (මෙලෙස භාවිතා කිරීමට නම්, කෙනෙක් තම ආහාරය කෑ යුත්තේ කෙසේදැයි සිතා ගනු)

## 16. ගොඩනැගිලි ඉදිකිරීමෙහි සීමාව ඉක්මවා නොයෑම

ඉමාම් බුහාරි තුමා, අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා දැන්වූ හදීසයක් තම සහීහුල් බුහාරි නම් කෘතියෙහි මෙසේ වාර්තා කරයි. සත්වයින් බලාගන්නා එඬේරා ගොඩනැගිලි තැනීමෙහි තරඟ වැදීම අවසන් හෝරාවෙහි සළකුණකි. යැයි නබි තුමාණෝ ප්‍රකාශ කළේය.

පොදුවේ ගොඩනැගිලි තැනීමේ දී ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව කබ්බාබ් රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ. මිනිසෙකු පස වෙනුවෙන් වියදම් කරන දෑ හැර තමන් වියදම් කරන අනෙකුත් සියලූ දෑ සඳහා ප්‍රතිඵල දෙනු ලබන්නේය. මූලාශ්‍රය අහ්මද්. මෙම හදීසය වෙනත් වචනවලින් අනස් රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළේ මෙසේය. ගොඩ නැගිලි සඳහා කරන වියදම් හැර එහි කිසිදු යහපතක් නැත.

තබරානි ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ. අල්ලාහ් ගැත්තෙකුට යම් අයහපකත් අපේක්ෂා කළේ නම්, ඔහු ගොඩනැගිලි තනා අවසන් කරන තෙක් එය අලංකාර කර පෙන්වන්නේය.

අබූ දාවූද්හි සඳහන් අබූ බෂ්ර් අල්-අන්සාරි රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීසයක් ද මෙයට සාපේක්ෂිතව දන්වා ඇත. එනම්, අල්ලාහ් යම් ගැත්තෙකුට අයහපතක් අපේක්ෂා කළේ නම් ගොඩනැගිලි තැනීමෙහි ඔහුගේ මුදල් වියදම් කරවන්නේය.

දිනක් අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් සහ ඉබ්නු ආස් රළියල්ලාහු අන්හු තුමාණන් බිත්තියක් ගොඩනගමින් සිටියදී ඒ අසලින් නබි තුමාණන් ගමන් කළේය. එවිට එතුමාණන් (සැබෑ කරුණ නම්) මෙයට වඩා පුදුම සහගතයි. යැයි පැවසූවේය.

## 17 නිවසෙහි අල්-කුර්ආනය පාරායනා කිරීම

නිවසෙහි අල්-කුර්ආනය පාරායනා කිරීම අභිවෘද්ධියට හා ෂෙයිතාන්ව එලවා හැරීමට සාධක වන්නේය. මේ පිළිබඳව අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා වාර්තා කළ හදීසයක්, මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. නුඹලාගේ නිවෙස් සොහොන් බවට පත් කර නොගන්න. කවර නිවසක සූරතුල් බකරා පාරායනා කරනු ලබන්නේ ද එම නිවසින් ෂෙයිතාන් පලා යන්නේය.

ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමාණන් විසින් වාර්තා කළ හදීසයක් ද මෙසේ සඳහන් කරයි. නුඹලාගේ නිවැස්හි නුඹලා සලාතයන් ඉටු කරන්න. ඒවා සොහොන් බවට පත් නොකරන්න. මෙම හදීසයන්ගෙන් පැහැදිලි වන්නේ, කබ්ර් නම් සොහොන් බිම් සලාතය ඉටු කිරීමට සුදුසු ස්ථානයක් නොවන බවයි. එමෙන්ම කවර නිවසක

සුන්නත් සලාතයන් ඉටු නොකරන්නේ ද, තවද අල්-කුර්ආනය පාරායනා නොකරන්නේ ද එවැනි නිවෙස් සුසාන භූමයකට සමාන කර පෙන්වා ඇත.

## 18. අවවාද කිරීමට පෙර නිවසේ සැඟවී සිටින නාගයා මරා දැමීමෙන් වැළකීම.

ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කළ හදීසයක් බුහාරි මුස්ලිම්හි මෙසේ සඳහන් වේ.

නිවසේ සැඟවී සිටින නාගයකු මරා දැමීම තහනම් කළේය. තවත් වාර්තාවක උන් නිවසේ ජින්නුන් යැයි සඳහන් වී ඇත. මෙයින් පෙන්වා දෙන්නේ අවවාද කිරීමට පෙර වූ තත්ත්ව යයි. එසේ නම් අවවාද කිරීමෙන් පසු උන් මරා දැමිය යුතුයි.

සර්ද් රළියල්ලාහු අන්හු තුමාණන් වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ සඳහන් වෙයි. මදීනාහ්වේ ඉස්ලාමය වැළදගත් ජින්නුන් කණ්ඩායමක් වූහ. එබැවින් ඔවුන්ගෙන් කිසිවෙක් හෝ නුඹලා දකින විට දින තුනක් ඔහුට අවසර දෙන්න. ඉන්පසුව ද නුඹලාට මතු වී පෙනෙන්නේ නම් එය මරා දමන්න. සැබැවින්ම එය ෂෙයිතාන්ය.

## 19. නිවැස් හිමියන්ට සලාම් ප්‍රකාශ කිරීම. මෙහි දී පිට මිනිසුන් ට පමණක් නොව නිවැසියන් සෑම කෙනෙකුටම මෙසේ සලාම් ප්‍රකාශ කරමින් නිවසට පිවිසිය යුතුයි.

නුඹලා නිවෙස්වලට පිවිසෙන විට නුඹලා අතර සලාම් කියනු. මෙය අල්ලාහ්ගේ සන්නිධානයෙන් වූ ආශිර්වාද ලත් පාරිශුද්ධ සුබ

පැතුමක්ය. නුඹලා මෙනෙහි කරනු පිණිස අල්ලාහ් මෙසේ නුඹලාට ආයාත් (වදන්) පැහැදිලි කරයිග (අල්-කුර්ආන් 24-61)

## 20. නිවසක පිරිමියෙක් තමාට විවාහ වීමට අවසර ඇති අන්‍ය කාන්තාවක් සමඟ තනිව රැඳී සිටීමෙන් වැළකීම.

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණෝ දිනක් මෙසේ ප්‍රකාශ කළහ. (කාන්තාවන් සිටින ස්ථානයට ඇතුල් වීම ගැන මම නුඹලාට අවවාද කරමි.) එවිට මිනිසෙකු නැගිට 'හුමු වු' පිළිබඳව ඔබේ අදහස කුමක් දැයි විමසුවේය. (මෙයින් අදහස් කෙරෙන්නේ ස්වාමි පුරුෂයාගේ සහෝදරයා හෝ තම පියාගේ සහෝදරයින්ගේ දරුවන් පිළිබඳ නීතිය ගැන කියා දෙන්න යනුයි. නැනා හා මස්සිනා යන අය) එවිට නබි තුමා හුමුව්වු මරණයයි යනු ප්‍රකාශ කළහ. එයින් අදහස් කෙරෙන්නේ නුඹලා මරණය පිළිබඳව අවවාදයෙන් (අවධානමෙන්) කටයුතු කරනවාක් මෙන් මේ පිළිබඳව ද අවවාදයෙන් කටයුතු කරන මෙන්ය. එසේත් නොමැති නම් ඔහු එසේ ඇතුල්වීමෙන් අදහස් කෙරෙනුයේ ඔහු දහමට පටහැනිව කටයුතු කළ අයෙකු ලෙසය. මෙලෙස පවසා ඇත්තේ එසේ ගැවසීමෙන් නොවිය යුතු දැයක් සිදුවන්නට සමහරවිට අවස්ථාවන් එළැඹිය හැකි නිසාය.

ස්ත්‍රියට ආශාව යනුවෙන් අල්ලාහ් නම් තබා ඇත. එබැවින් අල්ලාහ් අල්-කුර්ආනයේ 3 : 14 වැනි වැකියේ මෙසේ පවසා සිටියි. *"කාන්තාවන්ගෙන් දැඩි ආශාවට ඇලුම් කිරීම ජනයාට අලංකාර කර පෙන්වනු ලැබීය. "*

පිරිමින්ගේ සිත් තුළ කාන්තාවන් පිළිබඳව තිබෙන්නා වූ ආශාව ස්වභාවයකි. එබැවින් ඔවුන් ඒ වෙත නිතර නැඹුරු වන්නේය. මෙම

තත්ත්වය මත වැඩිවියට පත් කාන්තාවක් ඇය සමඟ නිතර සම්බන්ධතා පවත්නා කෙනෙකු සෙවීම ද ස්වභාවයකි.

නාලිම් නම් කවියකුගේ කවියේ අදහස මෙසේයග

මාර්ගයේ වැටී ඇති සෑම වස්තුවකටම අහුලන කෙනෙකි.

නොවිකිණෙන සෑම වස්තුවකටම කවදා හෝ වටිනාකමකි.

කාන්තාව කොටයක් මත වූ මස් කැබැල්ලකි. එය ආරක්ෂා නොකළේ නම්, ඩැහැගනු ලබන්නේය.

විශේෂයෙන්ම කිව යුතු කාරණයක් වන්නේ නිවසේ සේවකයින් සමඟ ඇයව තනිවීමට ඉඩ නොසැලස්විය යුතුයි. ඔවුන් සමඟ ගමන් බිමන් යෑම, සමීපවී ආශ්‍ර කිරීම ගැනීම, ආගමික කටයුත්තක් වුවද ඔවුන් සමඟ සාකච්චා කිරීම වැනි දැයින් අපගේ කාන්තාවන් ආරක්ෂා කිරීම අපගේ යුතුකමවේ. මෙවන් කරුණු අලජ්ජිත ක්‍රියාවන්හි වැටීමට හේතුසාධක වන්නේය. අපවත් සියලූ මුස්ලිම්වරුන්වත් පාපතර පිළිකුල් සහගත හැඟීම් හා ක්‍රියාවලින් ආරක්ෂා කරත්වා.

# 21. නිවසක් ඉදිඅකිරීමේ දී ඉඩපහසුකම් ඇතිව ඉදිකිරීම.

නිවැසියන්ගේ අවශ්‍යතාවයන්ට අනුව ඉඩ පහසුකම් සළසා ගැනීම ඉතා යහපත් වන්නේය. උදාහරණයක් වශයෙන් එක් කාමරයක් සහිත නිවසක මුළු පවුලම ජීවත් වීම සතුටු දායක කරුණක් නොවන්නේය.

අඹු සැමියන් අතර සිදුවන සියළු කටයුතු තමන්ගේ දරුවන් දකින තරමට එය අශෝභන වාතාවරණයක් උදා කරන්නේය. එබැවින් අවශ්‍යතාවයට අනුව කාමර හෝ වෙන්කර ගත් ස්ථාන තනා ගැනීම ඉතා වැදගත්ය. අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ හදීසයක් මෙසේ සඳහන් කරයි. සිව් දෙනෙකු ඉතා සතුටින් තම ජීවිතය ගත කරති. එයින් එක් අයෙක් ඉඩ පහසුකම් සහිත නිවසක් ඇත්තෙක්ය (මූලාශ්‍රය ඉබ්නු හිබ්බාන්)

## 22. නිවසේ මේසයක්, පොත් රාක්කයක් හෝ නවක දැයක් බලන්නට, කියවන්නට හෝ සවන් දීමට හැකි රේඩියෝ, රූපවාහිනි හෝ පරිසනක යන්තරක් වැනි දෙයක් තබා ගැනීම සතුටු දායකය.

මේවා නිවැසියන් තමන්ගේ වටිනා කාලය ආරක්ෂා කර ගැනීමට උපකාරී වනු ඇත. එමෙන්ම මෙමගින් තම වටිනා කාලය නොමනා දේ සඳහා වියදම් නොකර, තම ආධ්‍යාත්මික මෙන්ම අධ්‍යාපනික කටයුතු සඳහා භාවිතා කිරීමට වග බලාගත යුතුයි.

## 23. අල්ලාහ්ගේ නාම සඳහන් ඉවතලන පොත් පත් හෝ පත්‍රිකා අගෞරවයට ලක් නොවන අයුරින් ක්‍රියා කළ යුතුයි

අල්ලාහ්ගේ නාමයන් සඳහන් කළ දෑ ඉවත ලන්නේ නම්, ඒවා කුඩා තීරුකොට කපා හෝ ඒවා පුළුස්සා දමා ඉවත් කළ යුතුයි. එසේ

නොමැතිව එයට අගෞරවය වන පරිදි එම පත්‍රිකාවන් යමක් පිස දැමීමට හෝ යමක් එතීමට හෝ භාවිතා කිරීමෙන් වැළකිය යුතුයි.

මේ පිළිබඳව මැනවින් දන්නේ අල්ලාහ් පමණය.